# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 29 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 අගෝස්තු මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 අගෝස්තු මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිල : ශත 45 යි | තැපැල් ගාස්තුව : ශත 50 යි

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) "අනවසරයෙන් යම් රජයේ ඉඩමක සන්තකය දරන හෝ පදිංචිව සිටින යම් තැනැත්තකු" යන වචන වෙනුවට "යම් තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ උපවගන්තියේ (අ) ඡේදයෙහි—

(i) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයෙහි "ඉඩම රජයේ ඉඩමක් බව" යන වචන වෙනුවට "ස්වකීය මතය අනුව ඉඩම රජයේ ඉඩමක් බව" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) ඒ ඡේදයේ (iv) වන අනුඡේදයෙහි "ඒ තැනැත්තා අනවසරයෙන් ඒ ඉඩමේ සන්තකය දරන හෝ පදිංචිව සිටින බව" යන වචන වෙනුවට "ස්වකීය මතය අනුව, ඒ තැනැත්තා අනවසරයෙන් ඒ ඉඩමේ සන්තකය දරන හෝ පදිංචිව සිටින බව" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. 1981 අංක 58 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(අ) "නියම බලධරයා" යන්නෙහි අර්ථ කථනයෙහි—

(i) (ඊ), (උ) සහ (ඌ) යන ඡේද (උ), (ඌ) සහ (එ) යන ඡේද වශයෙන් නැවත අක්ෂර යෙදීමෙන් ; සහ

(ii) ඒ අර්ථ කථනයෙහි (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඊ) ඒ ඉඩම ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පාලනය යටතේ පවත්නා අවස්ථාවක, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා ද ;"

(ඇ) "ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය" යන්නෙහි අර්ථ කථනයෙහි "ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය අදහස් වේ ; තවද" යන වචන වෙනුවට "ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය අදහස් වේ ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) "රජයේ ඉඩම" යන්නෙහි අර්ථ කථනයෙහි "1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද යම් සංස්ථාවක් වෙත සතු කරන ලද්දා වූ හෝ එහි පාලනය යටතේ ඇත්තා වූ හෝ ඉඩම්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත හෝ 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද යම් සංස්ථාවක් වෙත සතු කරන ලද්දා වූ හෝ එහි පාලනය යටතේ ඇත්තා වූ හෝ ඉඩම්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඈ) "රජයේ ඉඩම" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිති ව ම, පහත දැක්වෙන අලුත් අර්ථ කථනය එකතු කිරීමෙන් :—

'"අනවසර සන්තකය හෝ පදිංචිය" යන්නෙන්, යම් ලිඛිත නීතියකට අනුකූලව රජය විසින් ප්‍රදානය කරන ලද විලංගු බලපත්‍රයක් හෝ වෙනත් ලිඛිත අධිකාරයක් මත ඉඩමේ සන්තකය දැරීම හෝ පදිංචිව සිටීම හැර, සෑම ආකාරයකම සන්තකය දැරීමක් හෝ පදිංචිව සිටීමක් ද අදහස් වන අතර, රජයේ ඉඩමකට අයුතු ලෙස ඇතුල් වී සන්තකය දැරීම හෝ පදිංචිව සිටීම ද ඇතුළත් වේ.'.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය පහත දැක්වෙන පරිදි, මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.*

(අ) එහි 'ආ' ආකෘතියේ (අ) ඡේදයෙහි—

(i) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයෙහි "විස්තර කර ඇති ඉඩම රජයේ ඉඩමකි" යන වචන වෙනුවට "විස්තර කර ඇති ඉඩම, මගේ මතයට අනුව, රජයේ ඉඩමකි" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) ඒ ඡේදයේ (iv) වන අනුඡේදයෙහි "අනවසරයෙන් එකී ඉඩමෙහි සන්තකය දරන" යන වචන වෙනුවට "මගේ මතයට අනුව, අනවසරයෙන් එකී ඉඩමෙහි සන්තකය දරන" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එහි 'ඇ' ආකෘතියෙහි—

(i) ඒ ආකෘතියේ (ii) වන ඡේදයෙහි "විස්තර කර ඇති ඉඩම රජයේ ඉඩමක් බවත්" යන වචන වෙනුවට "විස්තර කර ඇති ඉඩම මගේ මතයට අනුව, රජයේ ඉඩමක් බවත්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) ඒ ආකෘතියේ (iv) වන ඡේදයෙහි "අනවසරයෙන් එකී ඉඩමෙහි සන්තකය දරන" යන වචන වෙනුවට "මගේ මතයට අනුව, අනවසරයෙන් එකී ඉඩමෙහි සන්තකය දරන" යන වචන ආදේශ කිරීමෙන්.

විනිශ්චයට භාජනව පවත්නා ඉල්ලීම ආදිය.

7. (1) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දින යම් මහේස්ත්‍රාත් අධිකරණයකට ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය යටතේ නියම බලධරයකු විසින් කරන ලද යම් ඉල්ලීමක් ඒ අධිකරණයේ විනිශ්චයට භාජනව පවත්නා අවස්ථාවක, ඒ ඉල්ලීම, මේ පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව ඒ අධිකරණය විසින් විභාග කොට නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දින, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ, නියම බලධරයකු විසින් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් නැතහොත් නියම බලධරයකු විසින් කරනු ලැබූ නියමයක් හෝ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් කරන ලද යම් ආඥාවක් සම්බන්ධයෙන් හෝ වූ යම් කාරණාවක් පිළිබඳව නිසි අධිකරණ බලය ඇති යම් අධිකරණයක විනිශ්චයට භාජනව පවත්නා අවස්ථාවක, ඒ කාරණාව, මේ පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව ඒ නිසි අධිකරණ බලය ඇති අධිකරණය විසින් විභාග කොට නිශ්චය කරනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.